“කෙනෙකු මූත්රා කරමින් සිටිය දී දකුණතින් තම ලිංගය නො ඇල්ලිය යුතු ය. වැසිකිළි ගිය පසු තම දකුණතින් නො සේදිය යුතු ය. (පානය කරන) භාජනය තුළ හුස්ම නො හැරිය යුතු ය.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ කතාදා අල්-අන්සාරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “කෙනෙකු මූත්රා කරමින් සිටිය දී දකුණතින් තම ලිංගය නො ඇල්ලිය යුතු ය. වැසිකිළි ගිය පසු තම දකුණතින් නො සේදිය යුතු ය. (පානය කරන) භාජනය තුළ හුස්ම නො හැරිය යුතු ය.” [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඇතැම් විනයන් පිළිබඳ පැහැදිළි කර සිටියහ. ඒ අනුව මිනිසෙකු මූත්රා කරමින් සිටින අවස්ථාවේ තම දකුණතින් ලිංගය ඇල්ලීම හා ඉදිරිපස හෝ පසුපස තැවරී ඇති අපිරිසිදු දේ දකුණතින් ඉවත් කිරීම එතුමාණෝ තහනම් කළහ. සැබැවින්ම දකුණත ගරු කටයුතු සඳහා නිර්මාණය කරනු ලැබූවකි. එමෙන්ම පානය කරන භාජනයට හුස්ම හැරීම ද එතුමාණෝ තහනම් කළහ.

http://sunnah.global/hadeeth/si/show/3079